## මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# ජාතික රක්ෂණ භාර අරමුදල

# රැකියා පුරප්පාඩු

මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ජාතික රක්ෂණ භාර අරමුදල, අග්‍රහාර වෛද්‍ය රක්ෂණ, මෝටර් රථ රක්ෂණය වැනි රක්ෂණ යෝජන ක්‍රම ක්‍රියාත්මක කරන අතර දේශීය රක්ෂණකරුවන්ගේ ප්‍රතිරක්ෂකයා වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර ඇති එකම ආයතනය වේ. මෙම අරමුදල් මණ්ඩලය වසර 19ක් වැනි කෙටි කාලයක් තුළදී නව්‍යකරණය, වර්ධනය හා ලාභදායීත්වය සැලකීමේදී, දේශීය රක්ෂණ කර්මාන්තයේ ප්‍රමුඛ ස්ථානයක් හිමිකර ගෙන ඇති රාජ්‍ය ආයතනයකි.

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩුව සඳහා සුදුසුකම්ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 1. කළමනාකරණ සහකාර (MA 1-1) - III ශ්‍රේණිය

**බාහිර අයදුම්කරුවන්**

a. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී,

i. සිංහල/දෙමළ

ii. ඉංග්‍රීසි භාෂාව

iii. ගණිතය

ඇතුළු විෂයන් 04කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් 06කින් එක්වරකදී සමත් වීම.

**සහ**

b. අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය විෂයන් 03කින් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ප්‍රාථමික ශ්‍රේණිය පුහුණු, ප්‍රාථමික ශ්‍රේණිය- අර්ධ පුහුණු, ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු සේවා කාන්ඩවලට අයත් නිලධාරීන්,

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී,

i. සිංහල/දෙමළ

ii. ඉංග්‍රීසි භාෂාව

iii. ගණිතය

ඇතුළු විෂයන් 04කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් 06කින් සමත් වීම.

**සහ**

2. ඉහත සඳහන් ශ්‍රේණිවල ස්ථිර සේවයේ වසර 05ක සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

**වැටුප් පරිමාණය :** MA 1-1-2025:රු.46,220-10X540 + 7X630+ 4X890+ 20X1,190- 83,390 (කළමනාකරණ සේවා චක්‍රලේඛ : 01/2025 අනුව 2026/01/01 සිට රු.43,312.00 සහ 2027/01/01 සිට රු.46,220.00)

**වයස :** අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 2. පාරිභෝගික සේවා සහකාර (MA 1-2) - III ශ්‍රේණිය

**බාහිර අයදුම්කරුවන්**

a. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී,

i. සිංහල/දෙමළ

ii. ඉංග්‍රීසි භාෂාව

iii. ගණිතය

ඇතුළු විෂයන් 04කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් 06කින් එක්වරකදී සමත් වීම.

**සහ**

b. අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය විෂයන් 03කින් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

**සහ**

c. අවම වශයෙන් මාස 06ක පාරිභෝගික සේවා හැසිරවීම/ දුරකථන ඇමතුම් මධ්‍යස්ථානයේ මෙහෙයුම් සම්බන්ධ සේවා පළපුරුද්ද තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ප්‍රාථමික ශ්‍රේණිය පුහුණු, ප්‍රාථමික ශ්‍රේණිය- අර්ධ පුහුණු, ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු සේවා කාන්ඩවලට අයත් නිලධාරීන්,

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී,

i. සිංහල/දෙමළ

ii. ඉංග්‍රීසි භාෂාව

iii. ගණිතය

ඇතුළු විෂයන් 04කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් 06කින් සමත් වීම.

**සහ**

ඉහත සඳහන් ශ්‍රේණි වල ස්ථිර සේවයේ වසර 05ක සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

**වැටුප් පරිමාණය :** MA 1-2-2025:රු.46,220-10X540+ 7X630+ 12X1,080+ 12X1,280-84,350 (කළමනාකරණ සේවා චක්‍රලේඛ : 01/2025 අනුව 2026/01/01 සිට රු.43,312.00 සහ 2027/01/01 සිට රු.46,220.00)

**වයස :** අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 3. තොරතුරු තාක්ෂණ සහකාර (MA 2-1) - III ශ්‍රේණිය

**බාහිර අයදුම්කරුවන්**

ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමට (NVQ Level 05) අඩු නොවන පරිදි පිළිගත් තාක්ෂණික පුහුණු ආයතනයක් වෙතින් තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ සහතික පත්‍රයක් ලබාගෙන තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම්

**වැටුප් පරිමාණ :** MA 2-1-2025:රු.50,540-10X540 + 7X630+ 4X890+ 20X1,190- 87,710 (කළමණාකරණ සේවා චක්‍රලේඛ : 01/2025 අනුව 2026/01/01 සිට රු.46,960.00 සහ 2027/01/01 සිට රු.50,540.00)

**වයස :** අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**පත්වීම් :** මෙම පත්වීම් ස්ථිර පත්වීම් වේ. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට සඳහා හිමිකම් ඇත.

**සියලුම අයදුම්කරුවන්,**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට අදාළ කාර්යයන් සිදු කිරීම සඳහා මානසික හා ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු අතර දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමේ හැකියාව පැවතිය යුතුය.
- යහපත් චරිත ස්වභාවයකින් යුක්ත විය යුතුය.

**අයදුම්කරුවන්,**

- ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සහිතව සකස් කරන ලද ජීව දත්ත විස්තර සහිත අයදුම්පතක්, සියලුම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද සනාථ කිරීමේ පිටපත් සමඟ එවිය යුතු වේ. දැනටමත් රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත එවිය යුතු වේ.
- අයදුම්කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සටහන් කළ යුතුය.
- ප්‍රධාන විධායක නිලධාරී, ජාතික රක්ෂණ භාර අරමුදල, නො: 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ, ගාර්ඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනයට 2026.02.05 දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු වේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන විධායක නිලධාරී,**<br>**ජාතික රක්ෂණ භාර අරමුදල,**<br>**නො: 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,**<br>**කොළඹ 02.**